## 237 පුංචි පුංචි තාරකා

පුංචි පුංචි තාරකා නිල් අහස් තලේ
රැන්දූ රැන්දූ සේ පහන් දිස්නෙදී දිලේ
ඒ වගේ ඔබේ පෙමින් සිත් සතන් අපේ
පහන් කරන්නැ ජේසුනී ළමා ජීවිතේ

අපි වාගේ පුංචි බබෙකු වී
ඔබ ආවේ රැගෙන බව දුගී //
ජේසුනී ඔබේ ආදරේ මල් පිපී
ළමා අපේ සිතුම් පැතුම් සාර වේ

ඉවසූයේ වේදනා හැඟුම්
සිඳ ලූයේ පාපයේ බැඳුම් //
ජේසුනී ඔබේ ආදරේ මල් පිපී
ළමා අපේ සිතුම් පැතුම් සාර වේ

හෙළ මන්නේ ජීවිතේ පූදා
මට දුන්නේ ජීවිතේ සදා //
ජේසුනී ඔබේ ආදරේ මල් පිපී
ළමා අපේ සිතුම් පැතුම් සාර වේ